**සුරාබදු ආඥාපනත**

**අංක 03/2023 දරන සුරාබදු නිවේදනය**

**සුරාබදු බලපත්‍ර ස්ථාන විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන්**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 32 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් මෙම නිවේදනය මඟින් පහත උපලේඛනයෙහි දැක්වෙන සුරාබදු බලපත්‍ර ස්ථාන විවෘත කරනු ලබන හා වසනු ලබන වේලාවන් 2023 දෙසැම්බර් මස ..09.. වැනි දින සිට බලාත්මක බව ප්‍රකාශ කරමි.

2021 ජනවාරි මස 07 දිනැති අංක 2209/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 04/2021 දරන සුරාබදු නිවේදනය සහ 2018 ජනවාරි මස 18 දිනැති අංක 2054/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 03/2018 දරන සුරාබදු නිවේදනය පරිච්ඡින්න විය යුතුය.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 දෙසැම්බර් ..08.. වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

| | **I වැනි තීරුව** | **II වැනි තීරුව** |
|---|---|---|
| | **බලපත්‍ර වර්ගය** | **විවෘතව තැබිය යුතු වේලාවන්** |
| 1. | රට බීම තැබෑරුම් බලපත්‍රය | පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 |
| 2. | (i) රා තැබෑරුම් | පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 |
| | (ii) රා තැබෑරුම් (සමූපකාර ක්‍රමය යටතේ ක්‍රියාත්මක) | පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 |
| 3. | විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර.බී. 04) | පෙ.ව. 08.00 සිට ප.ව. 10.00 |
| 4. | හෝටල් බලපත්‍ර (ර.බී. 07) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ.ව. 10.00 සිට ප.ව. 11.00 |
| 5. | හෝටල් පියිකා බලපත්‍ර (ර.බී. 08) ) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ.ව. 10.00 සිට ප.ව. 11.00 |
| 6. | හෝටල් බලපත්‍ර (ර.බී. 07) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | පෙ.ව. 10.00 සිට පසුදින අළුයම 2.00 (තරු 3 හෝ ඊට ඉහළ වර්ගීකරණ හෝටල්)<br>පෙ.ව. 10.00 සිට මධ්‍යම රාත්‍රී 12 දක්වා (සෙසු හෝටල්) |
| 7. | හෝටල් පියිකා බලපත්‍ර (ර.බී. 08) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | |
| 8. | සිනමා ශාලා සඳහා ලබා දෙන විනෝද පියිකා බලපත්‍ර (ර.බී. 09) | පෙ.ව. 11.00 සිට ප.ව. 11.00 ( දර්ශන පෙන්වන අවස්ථාවල දී පමණි) |
| 9. | දුම්රිය ආපනශාලා බලපත්‍ර (ර.බී.10) | පෙ.ව. 11.00 සිට ප.ව. 11.00 |
| 10. | ආපනශාලා බලපත්‍ර (ර.බී. 11) සංචාරක මණ්ඩල අනුමැතිය රහිත | පෙ.ව. 10.00 සිට ප.ව. 11.00 |
| 11. | ආපනශාලා බලපත්‍ර (ර.බී. 11) සංචාරක මණ්ඩල අනුමැතිය සහිත | පෙ.ව. 10.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා |
| 12. | තානායම් බලපත්‍ර (ර.බී.12) | පෙ.ව. 10.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා |
| 13. | හිමිකාර සමාජශාලා බලපත්‍ර (ර.බී. 13) | පෙ.ව. 10.00 සිට මධ්‍යම රාත්‍රී. 12.00 දක්වා |
| 14. | සම්භාෂණ හා විනෝද කාර්යයන් සඳහා වන සමාජ ශාලා, ක්‍රීඩා සමාජ හා සාමාජිකයින් සඳහා පමණක් වන සමාජශාලා සඳහා වූ බලපත්‍ර (ර.බී. 13 ඒ) | පෙ.ව. 10.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා (මහ නගර සභා/ නගර සභා)<br>පෙ.ව. 11.00 සිට ප.ව. 11.00 (සෙසු ප්‍රදේශ වල) |
| 15. | බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍ර (ර.බී 22 ඒ) | පෙ.ව. 9.00 සිට ප.ව. 9.00 |

| | | |
|---|---|---|
| 16. | පරිශ්‍රය තුළ දී පරිභෝජනය කරන බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් බලපත්‍ර (ර.බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය රහිත පරිශ්‍රයන් සඳහා) | පෙ.ව. 10.00 සිට ප.ව. 11.00 |
| 17. | පරිශ්‍රය තුළ දී පරිභෝජනය කරන බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් බලපත්‍ර (ර.බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත පරිශ්‍රයන් සඳහා) | පෙ.ව. 10.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා |